අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

(4)

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/06/11-1 ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2024.02.27

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම විදුහල්පතිවරුන්

**අධ්‍යාපන කටයුතු සඳහා ආර්ථික අපහසුතා සහිත 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනැමෙන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන - 2024/ 2025**

දිවයිනේ සෑම පාසලක් ම ආවරණය වන පරිදි අධ්‍යාපනික සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා දක්ෂතා දක්වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහනක් ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

මෙම වැඩසටහන, දිවයිනේ පවතින රජයේ පාසල් 10,126ම (2022 වාර්ෂික සංගණන වාර්තාව - අධ්‍යාපන අමාත්‍යාංශය) ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට නියමිත අතර මේ යටතේ එක් පාසලකට පිරිනැමෙන උපරිම ශිෂ්‍යත්ව සංඛ්‍යාව ඇමුණුම 01 හි සඳහන් පරිදි එක් එක් පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගෙන සකස් කර ඇත. ඒ අනුව විදුහල්පතිවරුන් විසින් තම පාසලට අදාළ ශිෂ්‍යත්ව සංඛ්‍යාව තීරණයකර ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම සිදු කළ යුතු ය. මේ සඳහා සුදුසුකම් ලබන ශිෂ්‍යත්වලාභීන්ට වසරක් පුරා මසකට රු.3,000/- බැගින් මාස 12ක උපරිම කාල සීමාවක් සඳහා එම ශිෂ්‍යාධාර මුදල ලබා දෙනු ලැබේ.

**1 ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම්**

1.1
- 1 ශ්‍රේණියේ සිට 05 ශ්‍රේණිය දක්වා අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම 50% හෝ ඊට වැඩි හෝ ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක වීම.
- 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශ්‍රේණිවල, 2023 වසරේ දී පැවති අවසාන වාර පරීක්ෂණය අනුව පන්තියේ 1 - 20 දක්වා ස්ථාන ලබාගත් ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක වීම.

**සැ.යු. :- 2024 වර්ෂයේ 1 ශ්‍රේණියට ඇතුළත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ 2024 වර්ෂයේ පැවැත්වීමට නියමිත 2023 අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට මේ සඳහා අයදුම් කළ නොහැකි ය.**

1.2 රජයේ පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍යයෙක්/ශිෂ්‍යාවක් වීම.

1.3 ශිෂ්‍ය ශිෂ්‍යාවගේ පවුලේ මාසික ආදායම රු.100,000/- නොඉක්මවීම.

**2 අයදුම්පත් ඉදිරිපත් කිරීම.**

2.1 සෑම පාසලක ම විදුහල්පතිවරුන් විසින් මෙම ශිෂ්‍යත්ව වැඩසටහන පිළිබඳ ව තම පාසලේ සියලු ම ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුම්වත් කළ යුතුය.

2.2 මෙම ශිෂ්‍යත්වය ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය **(ඇමුණුම 02)** හා ඊට අදාළ උපදෙස් පත්‍රිකාව **(ඇමුණුම 03)** පාසලේ දැන්වීම් පුවරුවෙහි පළ කිරීමට විදුහල්පතිවරුන් විසින් කටයුතු කළ යුතු ය.

2.3 මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු සහ අයදුම්පත්‍රය ජනාධිපති අරමුදලේ නිල Facebook පිටුව වන www.facebook.com/president.fund සහ ජනාධිපති අරමුදලේ www.presidentsfund.gov.lk හා අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk යන වෙබ් අඩවිවල පළ කිරීමට කටයුතු කරනු ලැබේ.

2.4 ඉහත අංක 1 හි මූලික සුදුසුකම් සපුරා ඇති හා ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට කැමැති ශිෂ්‍ය ශිෂ්‍යාවන් අදාළ අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය **(ඇමුණුම 02)** අනුව සකස් කර ගත් අයදුම්පත අදාළ සහතිකවල පිටපත් සහිත ව **තම පාසලේ විදුහල්පති වෙත පමණක් නියමිත දිනට හෝ ඊට පෙර හෝ අතින් භාරදීමට කටයුතු කළ යුතු ය.**

2.5 ඉල්ලුම්කරුගේ පවුලේ මාසික ආදායම පිළිබඳ ව ග්‍රාම නිලධාරි විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ද සහිතව ඉදිරිපත් කළ යුතු ය. (ආදායම් වාර්තා ලබා ගැනීම අවශ්‍ය නැත.)

2.6 නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අදාළ අයදුම්පතෙහි සඳහන් සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සහතිකවල පිටපත් නොමැති සහ අඩුපාඩු සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

**3 තෝරා ගැනීමේ ක්‍රමවේදය (සියලු ශ්‍රේණි සඳහා)**

**3.1 පාසල් මට්ටම**

3.1.1 **මෙම චක්‍රලේඛයේ අංක 4 යටතේ දැක්වෙන නිර්ණායක හා ලකුණු පටිපාටිය මත පදනම් ව** පාසල් තේරීම් කමිටුවක් මඟින් ලැබී ඇති අයදුම්පත්වල ලකුණු පරීක්ෂා කළ යුතු ය. **පාසල් තේරීම් කමිටුව, විදුහල්පති හෝ විදුහල්පති විසින් බලය පවරන ලද නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරයකුගේ හෝ සභාපතීත්වයෙන් යුතුව ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වන පරිදි සකස් විය යුතු ය.**

3.1.2 සිසුන් විසින් නියමිත දින හෝ ඊට පෙර හෝ ලබාදෙනු ලබන අයදුම්පත්, පාසල් තේරීම් කමිටුවට යොමු කර අදාළ ලකුණු පරීක්ෂා කර සහතික කළ යුතු ය. පසුව එක් එක් සිසුවා ලබා ඇති ලකුණු මත මෙම ශිෂ්‍යත්වය ලබාදිය යුතු ඉතා ම සුදුසු **ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෝරා, ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලබන අනුපිළිවෙල මත ඇමුණුම 01හි සඳහන් ආකාරයට තම පාසලට අදාළ උපරිම ශිෂ්‍යත්ව සංඛ්‍යාවට සරිලන නාම ලේඛනය, ඉදිරිපත් කර ඇති අයදුම්පත ද සමඟින් ප්‍රමුඛතාගත කර පාසල අයත් වන අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නියමිත දින හෝ ඊට පෙර හෝ යොමු කළ යුතු ය.**

3.1.3 ශිෂ්‍යත්වලාභීන් පාසල් මට්ටමින් තෝරා ගැනීමේ දී ආර්ථික අපහසුතා හෝ වෙනත් යම්කිසි හේතුවක් මත හෝ යම් ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට මෙම ශිෂ්‍යත්වය ලබාදීම ඉතාම සුදුසු බවට පාසල් තේරීම් කමිටුව සෑහීමකට පත්වන්නේ නම්, එවැනි අවස්ථාවක මෙම ලකුණු මට්ටම් නොසලකා අදාළ කමිටුවේ අභිමතය පරිදි ශිෂ්‍යත්වය සඳහා තෝරා ගැනීමට කටයුතු කළ හැකි අතර, එම තෝරා ගැනීම පිළිබඳ ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගත යුතු ය. කෙසේ වුවද මෙලෙස සුවිශේෂී ව ලබා දෙනු ලබන ශිෂ්‍යත්ව සංඛ්‍යාව එක් පාසලකට උපරිම වශයෙන් එක් ශිෂ්‍යත්වයක් පමණි.

3.1.4 පාසල් මට්ටමින් තෝර ගත් ශිෂ්‍යත්වලාභීන්ට එම ශිෂ්‍යත්වලාභියා **සහ මව/පියා/භාරකරුගේ හවුල්කාරීත්වයෙන් යුතුව පවතින, මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි ආකාරයේ (විශේෂ බද්ධ ගිණුමක්) සක්‍රිය බැංකු ගිණුමක ඡායා පිටපත් සහ මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි විදුහල්පතිතුමා විසින් සහතික කරන ලද ඡායා පිටපත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.**

3.1.5 ඉදිරිපත් කර ඇති අනෙකුත් සියලුම අයදුම්පත් පාසලේ සුරැකිව තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

**3.2 කලාප මට්ටම**

3.2.1 මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධීකරණය සඳහා මාණ්ඩලික නිලධාරියෙකු පත් කිරීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතු ය.

3.2.2 විදුහල්පතිවරුන් විසින් යොමු කර ඇති ලේඛනවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අධීක්ෂණය යටතේ අදාළ කලාප අධ්‍යාපන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත ව කලාප මට්ටමේ තේරීම් කමිටුව පත් කර ගත යුතු ය.

3.2.3 **තේරීම් කමිටු මඟින් මෙම චක්‍රලේඛයේ අංක 04 යටතේ දැක්වෙන නිර්ණායක හා ලකුණු පටිපාටිය පදනම් කරගෙන පාසල් මට්ටමේදී ශිෂ්‍යත්වලාභීන් තෝරාගැනීමේ නිරවද්‍යතාව පරීක්ෂා කර එක් පාසලකට** ඇමුණුම 01හි සඳහන් ආකාරයට උපරිම ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව **තෝරා ගැනීම සිදු කළ යුතු ය.**

**(මේ සඳහා ශිෂ්‍යත්වලාභියා/ දෙමව්පියන් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම අවශ්‍ය නොවේ.)**

3.2.4 ➢ **ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට නිර්දේශ කරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ තොරතුරු, ලබාගත් ලකුණු අනුපිළිවෙල මත ඇමුණුම 04හි සඳහන් ආකෘතියේ දක්වා ඇති පරිදි කලාපයේ ඇති සියලුම පාසල් සඳහා එක ශිෂ්‍ය නාම ලේඛනයක් සකස් කළ යුතු ය.**

➢ **ඊට සමගාමීව තෝරාගත් ශිෂ්‍යත්වලාභීන්ගේ බැංකු ගිණුම් තොරතුරු සහිත ලේඛනය ද (ඇමුණුම 05හි සඳහන් ආකෘතිය අනුව) සකස් කිරීම කළ යුතු ය. (මේ සමඟ තේරී පත්වූ ශිෂ්‍යත්වලාභියා සහ මව/පියා/භාරකරුගේ හවුල්කාරීත්වයෙන් යුතුව පවතින මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි ආකාරයේ (විශේෂ බද්ධ ගිණුමක්) සක්‍රිය බැංකු ගිණුමක ඡායා පිටපත සහ මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ද ලබා ගෙන ඇමුණුම 05හි සඳහන් ආකෘතිය සමඟ ඉදිරිපත් කළ යුතු ය.)**

**සැ.යු. :- I. අදාළ සෑම ආකෘතියක ම ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛන අනුපිළිවෙල නොවෙනස්ව සඳහන් කිරීමට කටයුතු කළ යුතු අතර, ජාතික හැඳුනුම්පතේ සහ බැංකු ගිණුම්වල සඳහන් නම් අයදුම්පතේ සඳහන් කර ඇති නම් හා සමාන විය යුතු ය.**

**II. ශිෂ්‍යත්වලාභියා, මව/පියා නොමැතිව භාරකරුවෙකු ලඟ සිටී නම් තහවුරු කිරීමේ ලේඛනයක් ලබාගත යුතු ය.**

3.2.5 තෝරාගත් ශිෂ්‍යත්වලාභීන්ගේ ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර මෘදු හා දෘඪ පිටපත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු ය.**(මේ සමඟ තේරී පත්වූ ශිෂ්‍යත්වලාභියා විසින් ඉදිරිපත් කර ඇති හවුල්කාරීත්වයෙන් යුතු මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි ආකාරයේ (විශේෂ බද්ධ ගිණුමක්) සක්‍රිය බැංකු ගිණුමක ඡායා පිටපත සහ මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත ද යොමු කළ යුතු ය.)**

3.2.6 **චක්‍රලේඛයේ 3.2.1 හි සඳහන් කලාප සම්බන්ධීකරණ නිලධාරීන් විසින් පාසල් මඟින් යොමු කර ඇති අයදුම්පත් සහ නාම ලේඛන ගොනු කර තබා ගත යුතු ය.**

### 3.3 පළාත් මට්ටම

3.3.1 පළාත් මට්ටමේදී මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධීකරණය සඳහා මාණ්ඩලික නිලධාරියෙකු පත් කිරීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතු ය.

3.3.2 කලාප මට්ටමින් යොමු කරන ලේඛනවලට අනුව එක් පාසලකට උපරිම ශිෂ්‍යත්ව සංඛ්‍යාව ඇමුණුම 01හි සඳහන් ආකාරයට වන සේ පළාත් මට්ටමේ සමස්ත ලේඛනය සකස් කළ යුතු ය.

3.3.3 කලාප මට්ටමින් තෝරාගත් ශිෂ්‍ය නාම ලේඛනය **ඇමුණුම 04හි සඳහන් ආකෘතියේ** හා බැංකු ගිණුම් තොරතුරු ඇතුළත් ලේඛන **ඇමුණුම 05හි සඳහන් ආකෘතිය** පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නිර්දේශ කර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ පාසල් කටයුතු ශාඛාවට යොමු කළ යුතු ය.

3.3.4 අදාළ නාම ලේඛනවල මෘදු පිටපත් ජනාධිපති අරමුදලේ pfschol@presidentsoffice.lk සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ directorschoolactivities@yahoo.com යන විද්‍යුත් ලිපින වෙත නියමිත දිනට පෙර යොමු කිරීමට කටයුතු කළ යුතු ය.

### 3.4 ජාතික මට්ටම

3.4.1 **පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ** නිර්දේශ කර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබන තෝරාගත් ශිෂ්‍ය නාම ලේඛනය **ඇමුණුම 04හි සඳහන් ආකෘතිය** හා බැංකු ගිණුම් විස්තර ඇතුළත් ලේඛන **ඇමුණුම 05හි සඳහන් ආකෘතිය** නියමිත කාල සීමාවේ දී අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ද නිර්දේශ සහිතව ලේකම්, ජනාධිපති අරමුදල වෙත යොමු කරනු ඇත.

3.4.2 එලෙස යොමු කරනු ලබන යෝජිත ශිෂ්‍යත්වලාභීන් සඳහා පමණක් මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබේ.

## 4 නිර්ණායක හා ලකුණු පටිපාටිය

**අයදුම්කරුවෙකුට ලබාදිය හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 100 කි.**

### 4.1 <u>පවුල සම්බන්ධ තොරතුරු (අයදුම්පතේ අංක 01) - සියලු ශ්‍රේණි සඳහා</u>

දෙමව්පියන්ගෙන් යැපෙන වයස අවුරුදු 21ට අඩු පවුලේ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව සහ දෙමව්පියන් පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| 4.1.1 | ශිෂ්‍යයා/ශිෂ්‍යාව සමඟ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව දෙදෙනෙකු වූ විට | ලකුණු 03 |
| 4.1.2 | ශිෂ්‍යයා/ශිෂ්‍යාව සමඟ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව තිදෙනෙකු වූ විට | ලකුණු 04 |
| 4.1.3 | ශිෂ්‍යයා/ශිෂ්‍යාව සමඟ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව සිව්දෙනෙකු හෝ ඊට වැඩි හෝ වූ විට | ලකුණු 05 |
| 4.1.4 | දෙමව්පියන් දෙදෙනාගේම රැකවරණය අහිමි වීම | ලකුණු 10 |
| 4.1.5 | දෙමව්පියන්ගෙන් එක් අයෙකුගේ රැකවරණය අහිමි වීම | ලකුණු 05 |
| 4.1.6 | ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ පූර්ණ ශාරීරික දුබලතාවකදී<br>(අර්ධ දුබලතාවක් නම් ලකුණු 05 ක් පමණක් ලබා දීම) | ලකුණු 10 |

(උපරිම ලකුණු 25)

සැ.යු. :-

01. ඉහත 4.1.4හි දෙමව්පියන් දෙදෙනාගේම රැකවරණය අහිමි නම් උපරිම ලකුණු 10ක් හිමි වන අතර, 4.1.5හි දෙමව්පියන් දෙදෙනාගෙන් එක් අයෙකු අහිමිවීම නම් ලකුණු 05ක් පමණක් හිමි වේ.
02. සහෝදර සහෝදරියන් ලෙස සලකනු ලබන්නේ දෙමව්පියන්ගෙන් යැපෙන අවුරුදු 21 ට අඩු අවිවාහක දරුවන් ය. ශාරීරික දුබලතා පූර්ණ දුබලතාවක්ද නැතහොත් අර්ධ දුබලතාවක්ද යන්න පිළිබඳ ව රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

### 4.2 <u>ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කාර්ය සාධනය (අයදුම්පතේ අංක 02)</u>

**4.2.1 <u>1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා පමණි.</u>**

**4.2.1.1** 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍යයා/ශිෂ්‍යාව ළඟා කරගත් අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම

| ළඟා කර ගත් මට්ටම | ලකුණු |
|---|---|
| **100%** | ලකුණු **50** |
| **75%** | ලකුණු **40** |
| **50%** | ලකුණු **30** |
| | **(උපරිම ලකුණු 50)** |

**4.2.1.2 විෂය සමගාමී ක්‍රියාකාරකම් (පාසල් මට්ටමේ ජයග්‍රහණ)**

**පාසල් මට්ටමින් ක්‍රියාත්මක මළල ක්‍රීඩා/ චෙස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාතේ/ පරිසර ළමා සමාජ/ වාදනය/ ගායනය/ චිත්‍ර/ නැටුම්/ පෝතක බාලදක්ෂ/ කුඩා මිතුරි සහ වෙනත් අනුමත විෂය සමගාමී ක්‍රියාකාරකම්**

| ස්ථානය | පාසල් මට්ටම |
|---|---|
| පළමුවන ස්ථානය | ලකුණු 08 |
| දෙවන ස්ථානය | ලකුණු 07 |
| තුන්වන ස්ථානය | ලකුණු 06 |

(උපරිම ලකුණු 08)

**සැ.යු.:- ඉහත 4.2.1.2හිදී, එක් ශිෂ්‍යයකුට/ශිෂ්‍යාවකට විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීමේදී සාමූහික ක්‍රියාකාරකම් සඳහා ද ලකුණු ලබා දෙනු ලැබේ.**

**4.2.2 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යයා/ශිෂ්‍යාවන් සඳහා පමණි.**

**4.2.2.1 ශිෂ්‍යයා/ශිෂ්‍යාව 2023 වර්ෂයේ පැවති අවසාන වාර පරීක්ෂණයේ දී පන්තියේ ලබා ඇති ස්ථානය**

| | |
|---|---|
| 01 වන ස්ථානය සිට 03 වන ස්ථානය දක්වා | ලකුණු 50 |
| 04 වන ස්ථානය සිට 06 වන ස්ථානය දක්වා | ලකුණු 45 |
| 07 වන ස්ථානය සිට 10 වන ස්ථානය දක්වා | ලකුණු 40 |
| 11 වන ස්ථානය සිට 15 වන ස්ථානය දක්වා | ලකුණු 35 |
| 16 වන ස්ථානය සිට 20 වන ස්ථානය දක්වා | ලකුණු 30 |
| | (උපරිම ලකුණු 50) |

**4.2.2.2 විෂය සමගාමී ක්‍රියාකාරකම් (ක්‍රීඩා/ සෞන්දර්ය සහ වෙනත් (අයදුම්පතේ අංක 03))**

පාසල් මට්ටමින් ක්‍රියාත්මක තනි/ කණ්ඩායම් ක්‍රීඩා සහ මළල ක්‍රීඩා, විෂය සමගාමී ක්‍රියාකාරකම් (සමිති සමාගම් යනාදිය ද ඇතුළත් ව) ආදිය මඟින් ලබා ඇති ජයග්‍රහණ

| | පාසල් මට්ටම | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|---|
| පළමුවන ස්ථානය | 05 | 06 | 07 | 08 |
| දෙවන ස්ථානය | 04 | 05 | 06 | 07 |
| තුන්වන ස්ථානය | 03 | 04 | 05 | 06 |

(උපරිම ලකුණු 08)

**සැ.යු. :-**

- **එක් අවුරුද්දකට පමණක් ලකුණු ලබාදීමට යටත්ව, ආසන්න පසුගිය වසර 03ක් සලකා බැලීම සුදුසු ය.**
- **ඉහත 4.2.2.2හිදී, එක් ශිෂ්‍යයකුට/ශිෂ්‍යාවකට එක ම විෂය සමගාමී ක්‍රියාකාරකමක් සඳහා ජාතික, පළාත්, කලාප සහ පාසල් යන මට්ටම් තුනේ ම අනුයාත වසර 03කට අදාළ ව ජයග්‍රහණ පවතී නම් ලකුණු දීමේදී සැලකිල්ලට ගත යුත්තේ ඉහළ ම ලකුණු මට්ටම පමණි.**

**4.3 <u>ශිෂ්‍ය නායකත්වය (අයදුම්පතේ අංක 03) - සියලු ශ්‍රේණි සඳහා</u>**

| | |
|---|---|
| පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක / උප ප්‍රධාන ශිෂ්‍ය නායක | ලකුණු 07 |
| ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/කනිෂ්ඨ ) | ලකුණු 06 |
| පන්ති නායක | ලකුණු 05 |

(උපරිම ලකුණු 07)

**සැ.යු. :- ඉහත 4.3හිදි ලකුණු දීමේදී සැලකිල්ලට ගත යුත්තේ ඉහළම ලකුණු මට්ටම පමණි.**

**4.4 <u>අයදුම්කරු දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම (අයදුම්පතේ අංක 04) සියලු ශ්‍රේණි සඳහා (දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් නිකුත් කළ සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.)</u>**

| | |
|---|---|
| දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම<br>(වසරකට වැඩි කාලයක් දහම් අධ්‍යාපනය ලැබීම සහ මේ වන විටත් දහම් පාසලක ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක ලෙස කටයුතු කිරීම.) | ලකුණු 10 |

(උපරිම ලකුණු 10)

- සියලු ලියාපදිංචි ආගමික දහම් පාසල් මේ යටතට අයත් වේ.

**5 ශිෂ්‍යත්ව ප්‍රදානය**

5.1 මෙම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2024 අප්‍රේල් මස සිට 2025 වර්ෂයේ මාර්තු මස දක්වා මාසිකව රු.3,000 බැගින් ශිෂ්‍යත්ව ලබාදීමට නියමිත ය. **ශිෂ්‍යත්වලාභීන් තෝරා ගත් පසුව අදාළ මුදල ලබාදී ඇති ශිෂ්‍යත්වලාභියාගේ සහ මව/පියා/භාරකරුගේ හවුල්කාරීත්වයෙන් යුතුව පවතින මාසිකව ශිෂ්‍යාධාර ලබා ගත හැකි ආකාරයේ (විශේෂ බද්ධ ගිණුමක) සක්‍රිය බැංකු ගිණුමකට පමණක් සෘජුව ම මුදල් බැර කරනු ලැබේ.**

5.2 යම් ශිෂ්‍යත්වලාභියකු කිසියම් හේතුවක් නිසා දැනට ඉගෙනුම ලබන පාසලෙන් විධිමත් ලෙස ඉවත් ව වෙනත් පාසලකට ඇතුළත් වූයේ නම්, ඒ බව තහවුරු කරන ලිපියක් නව පාසලේ විදුහල්පති මඟින් (ඇමුණුම 06හි ආකෘතිය අනුව) ජනාධිපති අරමුදල වෙත දන්වා එවිය යුතු ය.

**6 ශිෂ්‍යත්ව නියාමනය**

6.1 ශිෂ්‍යත්ව නියාමනය කලාප මට්ටමින් සිදු කිරීම අදාළ සිසුන් ඉගෙනුම ලබන පාසල අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතුය. ඒ සඳහා පත් කළ සම්බන්ධීකරණ නිලධාරියාට අදාළ වගකීම පැවරිය යුතු ය.

6.2 පළාත් මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු අතර, ඒ සම්බන්ධ වගකීම අදාළ සම්බන්ධීකරණ නිලධාරියාට පැවරිය යුතු ය.

6.3 ජාතික මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව සහ ජනාධිපති අරමුදල මඟින් සිදු කරනු ඇත.

7 ශිෂ්‍යත්ව අවලංගු කිරීම

පහත සඳහන් හේතු මත මෙම ශිෂ්‍යත්වලාභීන් වෙත ලබාදෙන ශිෂ්‍යත්ව අවලංගු කිරීමේ බලය ජනාධිපති අරමුදල සතු ය.

I. ශිෂ්‍යත්වලාභියා විනය විරෝධී හැසිරීමක් සඳහා දඬුවම් ලැබීම.
II. පිළිගත හැකි හේතුවක් නොදන්වා දින 21ක් අඛණ්ඩ ව පාසලට නොපැමිණීම.
III. පාසල් අධ්‍යාපන කටයුතුවලින් බැහැර වීම. (පාසල් හැරයාමේ සහතිකය නිකුත් කිරීම.)
IV. ගාස්තු ගෙවනු ලබන ජාත්‍යන්තර පාසලකට ඇතුළත් වීම.

8 ශිෂ්‍යත්ව සම්බන්ධ තොරතුර දැන ගැනීම

මෙම උපදෙස් ලිපියේ සඳහන් යම් කරුණක් පිළිබඳ පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, පහත සඳහන් විද්‍යුත් තැපැල වෙත (Email) පණිවිඩයක් එවීම හෝ දුරකථන අංකය වෙත අමතා හෝ අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි ය.

**විද්‍යුත් තැපැල (Email) :-** pfschol@presidentsoffice.lk
දුරකථන අංකය **:- 011- 2 354 354 (දිගුව - 4830/ 4835/ 4837)**
**WhatsApp** අංකය **:- 074 -085 4527 (පණිවුඩ පමණි.)**

9 කාල රාමුව

| | කාර්යය | කාලය (අදාළ කාර්යය නිම කළ යුතු අවසන් දිනය) |
|---|---|---|
| 9.1 | අයදුම්පත් කැඳවීම | 2024.02.27 |
| 9.2 | සම්පූර්ණ කරන ලද අයදුම්පත් විදුහල්පති වෙත භාර දීම | 2024.03.20 |
| 9.3 | පාසල් මට්ටමින් සුදුසුකම්ලාභීන් තෝරාගැනීමේ කටයුතු සිදු කර විදුහල්පති විසින් පාසල් මට්ටමින් තෝරාගත් ශිෂ්‍ය නාම ලේඛන කලාප අධ්‍යාපන කාර්යාලයට යොමු කිරීම. | 2024.04.01 |
| 9.4 | කලාප මට්ටමින් සුදුසුකම්ලාභීන් තෝරාගැනීමේ කටයුතු සිදු කර තෝරාගත් ශිෂ්‍යත්වලාභී නාම ලේඛන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට යොමු කිරීම. | 2024.04.22 |
| 9.5 | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් මට්ටමේ අදාළ නාම ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව වෙත යොමු කිරීම. | 2024.04.26 |
| 9.6 | අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් එම ලේඛන ජනාධිපති අරමුදල වෙත යොමු කිරීම. | 2024.04.30 |

**දැනට ක්‍රියාත්මක වන වෙනත් ඕනෑ ම ශිෂ්‍යාධාර වැඩසටහනක් යටතේ ශිෂ්‍යාධාර හෝ ශිෂ්‍යත්ව හෝ හිමි වුවද මේ සඳහා මූලික සුදුසුකම් සපුරන්නේ නම් මෙම වැඩසටහන සඳහා ද අයදුම් කළ හැකි ය.**

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් කිසියම් ගැටලුවක් මතු වන්නේ නම් ඒ පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

වසන්තා පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

01. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කාරුණික දැන ගැනීම සඳහා
02. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
03. ලේකම්, ජනාධිපති අරමුදල - කාරුණික දැන ගැනීම සඳහා

Annex - 01

# No of students selected as per the students population

| SR No | School Type | Government Schools by size of Students Population | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1-50 | 50 - 100 | 101 - 200 | 201 - 500 | 501-1000 | 1001-2000 | 2001/3000 | 3001/4000 | 4000 above |
| 1 | 1AB | | | 7 | 107 | 254 | 362 | 178 | 66 | 34 |
| 2 | 1C | | 34 | 200 | 886 | 643 | 172 | 16 | | |
| 3 | Type 2 | 140 | 556 | 1,188 | 1,144 | 154 | 32 | 5 | 2 | |
| 4 | Type 3 | 1,333 | 981 | 765 | 538 | 286 | 43 | | | |
| | Total School | 1,473 | 1,571 | 2,160 | 2,675 | 1,337 | 609 | 199 | 68 | 34 |
| No of Students as per the student population | | 4 | 6 | 8 | 12 | 14 | 16 | 18 | 20 | 22 |
| Total no's of students selected as per the students population | | 5,892 | 9,426 | 17,280 | 32,100 | 18,718 | 9,744 | 3,582 | 1,360 | 748 |
| Total Students | | | | | | | | | | 98,850 |

1AB - Schools having Science Streams classes in Advanced level
1C - School having Advanced level classes other than Science stream
Type 2 - School having classes only up to Grade 11
Type 3 - School having classes only up to Grade 5 or Grade 11
Source - Annual School Census of Sri Lanka Summary Report - 2022 - Ministry of Education

E.M.S.B. Ekanayake
Secretary to the President
22 .02.2024

ඇමුණුම 02

කාර්යාලයිය ප්‍රයෝජනය සඳහා :-

අධ්‍යාපන කටයුතු සඳහා ආර්ථික අපහසුතා සහිත 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනමන ජනාධිපති ශිෂ්‍යත්ව සඳහා වූ අයදුම්පත්‍රය - 2024/2025

(කරුණාකර අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර උපදෙස් පත්‍රිකාව බලන්න.)

## I කොටස

පළාත :- .............................. දිස්ත්‍රික්කය:- ...................... අධ්‍යාපන කලාපය :- ..............................

**01** ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ පෞද්ගලික තොරතුරු

1.1 ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ මුලකුරු සමග නම (සිංහලෙන්) :- ..............................

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :- ..............................

1.3 මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) :- ..............................

1.4 අධ්‍යාපනය ලබන පාසලේ නම :- ..............................

1.5 ඉගෙනුම ලබන ශ්‍රේණිය :- ..............................

1.6 උපන් දිනය :- [ ][ ][ ][ ] [ ][ ] [ ][ ] (YYYY –MM –DD)

1.7 මව /පියා/භාරකරුගේ නම ..............................

1.8 මව /පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

1.9 දුරකථන අංකය (කෙටි පණිවුඩ යැවිය හැකි) :- [0][7][ ][ ][ ][ ][ ][ ][ ][ ]

1.10 දුරකථන අංකය (සම්බන්ධ කර ගත හැකි) :- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

1.11 පෞද්ගලික ලිපිනය (සිංහල) :- ..............................
..............................

1.12 පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි) :- ..............................
..............................

---

## II කොටස

01. පවුල සම්බන්ධ තොරතුරු - සියලු ශ්‍රේණි සඳහා

දෙමව්පියන්ගෙන් යැපෙන වයස අවුරුදු 21ට අඩු පවුලේ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව සහ දෙමව්පියන් පිළිබඳ විස්තර

| | | | ලකුණු |
|---|---|---|---|
| 1.1 | ශිෂ්‍යයා/ ශිෂ්‍යාව ඇතුළුව සහෝදර සහෝදරියන් සංඛ්‍යාව දෙදෙනෙකු වූ විට | :- | |
| 1.2 | ශිෂ්‍යයා/ ශිෂ්‍යාව ඇතුළුව සහෝදර සහෝදරියන් සංඛ්‍යාව තිදෙනෙකු වූ විට | :- | |
| 1.3 | ශිෂ්‍යයා/ ශිෂ්‍යාව ඇතුළුව සහෝදර සහෝදරියන් සංඛ්‍යාව සිව් දෙනෙකු හෝ ඊට වැඩි වූ විට | :- | |
| 1.4 | ඔබ, මව්පිය දෙදෙනාගේම රැකවරණය යටතේ සිටින්නේද? ඔව්/නැත | :- | |
| 1.5 | ඔබ, මව හෝ පියා යන දෙදෙනාගෙන් එක් අයෙකු යටතේ පමණක් රැකවරණයේ සිටින්නේද? ...................... පමණක් සිටී. | :- | |
| 1.6 | ඔබ, ශාරීරික දුබලතාවකින් පෙළෙන්නේද? ඔව්/නැත<br>ඒ දුබලතාව කුමක්ද? .............................. | :- | |
| | | එකතුව<br>(උපරිම ලකුණු සංඛ්‍යාව 25 කි.) | |

02 ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කාර්ය සාධනය

2.1 <u>1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පමණි.</u>

2.1.1 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍යයා/ශිෂ්‍යාවන් ලබා කරගත් අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම

| ලබා කර ගත් මට්ටම | ලකුණු |
|---|---|
| 100% | |
| 75% | |
| 50% | |
| (උපරිම ලකුණු සංඛ්‍යාව 50) | |

2.1.2 පාසල් මට්ටමින් ක්‍රියාත්මක මළල ක්‍රීඩා/ වෙස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාතේ/ පරිසර ළමා සමාජ/ වාදනය/ ගායනය/ චිත්‍ර/ නැටුම්/ පෝතක බාලදක්ෂ/ කුඩා මිතුරි සහ වෙනත් අනුමත විෂය සමගාමී ක්‍රියාකාරකම්

| විෂය සමගාමී ක්‍රියාකාරකම් | පාසල් මට්ටම | | |
|---|---|---|---|
| | 1 වන ස්ථානය | 2 වන ස්ථානය | 3 වන ස්ථානය |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| | | එකතුව | |

(උපරිම ලකුණු සංඛ්‍යාව 08)

2.2 <u>6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යයා ශිෂ්‍යාවන් සඳහා පමණි.</u>

2.2.1 ශිෂ්‍යයා/ ශිෂ්‍යාව 2023 වර්ෂයේ පැවති අවසාන වාර පරීක්ෂණයේ දී ලබා ඇති ස්ථානය

| ස්ථානය | අයදුම්කරු ලබා ගත් ස්ථානය | ලකුණු |
|---|---|---|
| 01 වන ස්ථානයේ සිට 03 වන ස්ථානය දක්වා | | |
| 04 වන ස්ථානයේ සිට 06 වන ස්ථානය දක්වා | | |
| 07 වන ස්ථානයේ සිට 10 වන ස්ථානය දක්වා | | |
| 11 වන ස්ථානයේ සිට 15 වන ස්ථානය දක්වා | | |
| 16 වන ස්ථානයේ සිට 20 වන ස්ථානය දක්වා | | |
| | එකතුව (උපරිම ලකුණු සංඛ්‍යාව 50 කි.) | |

2.2.2 **විෂය සමගාමී ක්‍රියාකරකම් (ක්‍රීඩා/ සෞන්දර්ය සහ වෙනත්)**

පාසල් මට්ටමින් ක්‍රියාත්මක තනි/ කණ්ඩායම් ක්‍රීඩා සහ මළල ක්‍රීඩා, විෂය සමගාමී ක්‍රියාකාරකම් (සමිති සමාගම යනාදිය ද ඇතුළත් ව) ආදිය මගින් ලබා ඇති ජයග්‍රහණ

| ක්‍රීඩා, සෞන්දර්යය සහ වෙනත් | පාසල් මට්ටම (උපරිම ලකුණු 05) | | කලාප මට්ටම (උපරිම ලකුණු 06) | | පළාත් මට්ටම (උපරිම ලකුණු 07) | | ජාතික මට්ටම (උපරිම ලකුණු 08) | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය |
| 1. | | | | | | | | |
| 2. | | | | | | | | |
| 3. | | | | | | | | |

එකතුව

(උපරිම ලකුණු සංඛ්‍යාව 08 කි.)

03. ශිෂ්‍ය නායකත්වය - සියලු ශ්‍රේණි සඳහා

| | | ලකුණු |
|---|---|---|
| 01 | පාසල් ප්‍රධාන ශිෂ්‍ය නායක/පාසල් උපප්‍රධාන ශිෂ්‍ය නායක | |
| 02 | ශිෂ්‍ය නායක (කනිෂ්ඨ/ජ්‍යෙෂ්ඨ) | |
| 03 | පන්ති නායක | |
| | එකතුව (උපරිම ලකුණු සංඛ්‍යාව 07 කි.) | |

04. **ශිෂ්‍යයා/ ශිෂ්‍යාව දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම. - සියලු ශ්‍රේණි සඳහා**
**(දහම් පාසල් ප්‍රදානාචාර්ය විසින් නිකුත් කළ සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.)**

| | | ලකුණු |
|---|---|---|
| 01 | දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම | |

(උපරිම ලකුණු සංඛ්‍යාව 10කි.)

05. ලකුණු සාරාංශය

| | | |
|---|---|---|
| 01 | පවුල සම්බන්ධ තොරතුරු | |
| 02. | **ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කාර්ය සාධනය** | |
| | 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා<br>• අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම<br>• විෂය සමගාමී ක්‍රියාකරකම් | |
| | 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා<br>• **අවසාන වාර පරීක්ෂණයේ දී ලබා ඇති ස්ථානය**<br>• විෂය සමගාමී ක්‍රියාකරකම් | |
| 03. | ශිෂ්‍ය නායකත්වය | |
| 04. | ශිෂ්‍යයා/ ශිෂ්‍යාව දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම. | |

**ලබාගෙන ඇති මුළු ලකුණු** සංඛ්‍යාව

ඉහත දැක්වෙන කරුණු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. අවශ්‍ය අවස්ථාවකදී අදාළ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට එකඟ වෙමි.

දිනය : .........................          ..........................          ..................................................................
අයදුම්කරුගේ අත්සන          මව/පියා/භාරකරුගේ නම සහ අත්සන

අයදුම්කරු විසින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

දිනය : .........................          ..................................................................
පන්තිභාර ගුරුවරයා/ගුරුවරියගේ නම සහ අත්සන

පවුලේ මාසික ආදායම පිළිබඳ ප්‍රකාශය :-

(මව/පියා/භාරකරු විසින් සම්පූර්ණ කළ යුතුය.)

මම .............................................................................................. රැකියාව කරමි./ රැකියාවක් නොකරමි.
(රැකියාව කුමක්ද යන්න)

මගේ ස්වාමිපුරුෂයා/භාර්යාව.................................................... ආයතනයේ රැකියාව කරනු ලබයි./ රැකියාවක් කරනු නොලබයි. අප පවුලේ මාසික ආදායම රු: ................................ බව ද ප්‍රකාශ කරමි.

..........................................
මව/පියා/භාරකරුගේ අත්සන

දිනය: ..................... නම : ....................................

ඉහත සඳහන් ආදායම පිළිබඳ කරුණු නිවැරදි බව සහතික කරමි.

....................................
ග්‍රාම නිලධාරිගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය: .......................

ඉහත ආදායම පිළිබඳ කරුණු නිවැරදි බවට නිර්දේශ කරමි.

...............................
ප්‍රාදේශීය ලේකම්
(නිල මුද්‍රාව)

දිනය: .....................

පාසල් තේරීම් කමිටුවේ සාමාජිකයන්ගේ විස්තර හා නිර්දේශය :-

| | නම | තනතුර | අත්සන | නිර්දේශ කරමි/නොකරමි |
|---|---|---|---|---|
| 1. | ........................................... | .............................. | ......................... | .............................. |
| 2. | ........................................... | .............................. | ......................... | .............................. |
| 3. | ........................................... | .............................. | ......................... | .............................. |

---

**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,**

ඉහත 1-5 දක්වා සඳහන් කර ඇති ලකුණු පාසල් තේරීම් කමිටුව මඟින් පරීක්ෂා කළ බවත්, අනෙකුත් පෞද්ගලික තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි. එබැවින් ...................................................ශිෂ්‍යයා/ශිෂ්‍යාව විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත කලාපීය තේරීම් කමිටුව වෙත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

එසේම ශිෂ්‍යත්වලාභියාගේ මව/පියා/භාරකරුගේ හවුල්කාරිත්වයෙන් යුතුව පවතින මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි ආකාරයේ (විශේෂ බද්ධ ගිණුමක්) සක්‍රිය ගිණුමේ සහ මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් මේ සමඟ අමුණා ඇත.

...............................
විදුහල්පතිගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය: ...................

---

**කලාප කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා,**

කලාපයේ තේරීම් කමිටුවේ සාමාජිකයන්ගේ විස්තර

| | නම | තනතුර | අත්සන |
|---|---|---|---|
| 1. | ........................................... | .............................. | ......................... |
| 2. | ........................................... | .............................. | ......................... |
| 3. | ........................................... | .............................. | ......................... |

# උපදෙස් පත්‍රිකාව

**අධ්‍යාපන කටයුතු සඳහා ආර්ථික අපහසුතා සහිත 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනැමෙන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන -2024/2025**

සුදුසුකම්

- 1 ශ්‍රේණියේ සිට 05 ශ්‍රේණිය දක්වා අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම 50% හෝ ඊට වැඩි හෝ ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක වීම.

  6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශ්‍රේණිවල, 2023 වසරේදි පැවති අවසාන වාර පරීක්ෂණය අනුව 1 - 20 දක්වා ස්ථානයන් ලබාගත් ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක වීම.

  **සැ.යු. :- 2024 වර්ෂයේ 1 ශ්‍රේණියට ඇතුළත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ 2024 වර්ෂයේ පැවැත්වීමට නියමිත 2023 අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට මේ සඳහා අයදුම්කළ නොහැකි ය.**

- රජයේ පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍යයෙක්/ ශිෂ්‍යාවක් වීම.

- ශිෂ්‍ය ශිෂ්‍යාවගේ පවුලේ මාසික ආදායම රුපියල් 100,000/= නොඉක්මවීම.

අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සහ භාර දීම.

- අයදුම්පත්‍රයේ I කොටස සහ II කොටසේ අංක 01 සිට 05 දක්වා කොටස් ශිෂ්‍යයා/ශිෂ්‍යාව විසින් සම්පූර්ණ කළ යුතු අතර ලකුණු ලබා දීමද ශිෂ්‍ය ශිෂ්‍යාව විසින් ම සිදු කල යුතු ය. අදාළ ලකුණු විදුහලේ තේරීම් කමිටුව විසින් පරීක්ෂා කර සහතික කල යුතු ය.

  **සැ.යු :- 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ශිෂ්‍යයා/ශිෂ්‍යයාවගේ අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම අනුව පන්තිභාර ගුරුවරයා/ගුරුවරිය විසින් නිවැරදි ලකුණු ලබාදීම සිදු කළ යුතු ය.**

- සෑම විටම නිවැරදිම තොරතුරු ඇතුලත් කල යුතු ය.

- කෙටි පණිවුඩ යැවීමට හැකි දුරකථන අංකයක් සඳහන් කළ යුතුය. ඔබ වෙත එවැනි දුරකථන අංකයක් නොමැති නම්, පවුලේ ලඟම ඥාතියෙකුගේ/ පාසලේ ගුරුවරයකුගේ/ විදුහල්පතිතුමාගේ දුරකථන අංකයක් ඔවුන්ගේ එකඟතාවය සහිතව ලබා දීමට කටයුතු කල යුතු ය.

- පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳව තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේ සහතිකයද, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයද (ආදායම් වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය නොවේ) සමගින් **සම්පූර්ණ කරන ලද අයදුම්පත තම පාසලේ විදුහල්පති වෙත පමණක් 2024.03.20 වන දින හෝ ඊට පෙර අතින් භාර දිය යුතු ය.**

> විදුහල්පති විසින් තම පාසලට උපරිම ශිෂ්‍යත්වලාභින් ගණන තෝරාගත් බව දැනුම් දුන් පසු එම ශිෂ්‍යත්වලාභියාගේ මව/පියා/භාරකරුගේ හවුල්කාරිත්වයෙන් යුතුව පවතින මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි ආකාරයේ (විශේෂ බද්ධ ගිණුමක්) සක්‍රිය ගිණුමක් මහජන බැංකුවේ, ලංකා බැංකුවේ හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ශාඛාවකින් විවෘත කර, එම ගිණුමේ තොරතුරු සඳහන් පිටුවේ සහ මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි පැහැදිලි ඡායා පිටපතක් විදුහල්පති වෙත ඉදිරිපත් කළ යුතුය. එම ඡායා පිටපත් විදුහල්පති විසින් සහතික කළ යුතු ය.
>
> සැ.යු :- කෙසේ වුවද විදුහල්පති විසින් ශිෂ්‍යත්වලාභියෙකු ලෙස තෝරාගත් බව දන්වන තෙක් බද්ධ ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය නැත.

- **කිසිදු අවස්ථාවක අයදුම්පත් ජනාධිපති කාර්යාලයට හෝ ජනාධිපති අරමුදල වෙත ගෙනවිත් භාර දීම හෝ තැපැල මගින් යොමු නොකළ යුතුය.**

## 01. ලකුණු ලබා දීමේ ක්‍රමවේදය - සියලු ශ්‍රේණි සඳහා

**1.** පවුල සම්බන්ධ තොරතුරු

දෙමව්පියන්ගෙන් යැපෙන වයස අවුරුදු 21ට අඩු පවුලේ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව සහ දෙමව්පියන් පිළිබඳ විස්තර

ලකුණු

| | | |
|---|---|---|
| 1.1 | ශිෂ්‍යයා/ශිෂ්‍යාව සමඟ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව දෙදෙනෙකු වූ විට | 03 |
| 1.2 | ශිෂ්‍යයා/ශිෂ්‍යාව සමඟ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව තිදෙනෙකු වූ විට | 04 |
| 1.3 | ශිෂ්‍යයා/ශිෂ්‍යාව සමඟ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව සිව්දෙනෙකු හෝ ඊට වැඩි වූ විට | 05 |
| 1.4 | ශිෂ්‍යයාට/ශිෂ්‍යාවට දෙමව්පියන් දෙදෙනාගේම රැකවරණය අහිමිවීම | 10 |
| 1.5 | දෙමව්පියන්ගෙන් එක් අයෙකුගේ රැකවරණයේ අහිමිවීම | 05 |
| 1.6 | ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ පූර්ණ ශාරීරික දුබලතාවකදී<br>(අර්ධ දුබලතාවක් නම් ලකුණු 05 ක් පමණක් ලබා දෙන්න) | 10 |

(උපරිම ලකුණු 25 )

සැ.යු. :- ඉහත 1.4 හි දෙමව්පියන් දෙදෙනාම රැකවරණය අහිමි නම් උපරිම ලකුණු 10ක් හිමි වන අතර, 1.5 හි දෙමාව්පියන් දෙදෙනාගෙන් එක් අයෙකුගේ රැකවරණය අහිමිවීම නම් ලකුණු 05ක් පමණක් හිමි වේ.

සහෝදර සහෝදරියන් ලෙස සලකනු ලබන්නේ දෙමව්පියන්ගෙන් යැපෙන අවුරුදු 21 ට අඩු අවිවාහක දරුවන්ය. ශාරීරික දුබලතාවය, පූර්ණ දුබලතාවක්ද නැතහොත් අර්ධ දුබලතාවක්ද යන්න පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

## 02. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කාර්ය සාධනය

### 2.1. 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා පමණි.

**2.1.1.** 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍යයා/ශිෂ්‍යාවන් ළඟා කරගත් අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම

| ළඟා කර ගත් මට්ටම | ලකුණු |
|---|---|
| **100%** | ලකුණු **50** |
| **75%** | ලකුණු **40** |
| **50%** | ලකුණු **30** |
| | **(උපරිම ලකුණු 50)** |

**2.1.2** විෂය සමගාමී ක්‍රියාකාරකම්

**පාසල් මට්ටමින් ක්‍රියාත්මක මළල ක්‍රීඩා/ චෙස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාතේ/ පරිසර ළමා සමාජ/ වාදනය/ ගායනය/ චිත්‍ර/ නැටුම්/ පෝතක බාලදක්ෂ/ කුඩා මිතුරි සහ වෙනත් අනුමත විෂය සමගාමී ක්‍රියාකාරකම්**

| ස්ථානය | පාසල් මට්ටම |
|---|---|
| පළමුවන ස්ථානය | ලකුණු 08 |
| දෙවන ස්ථානය | ලකුණු 07 |
| තුන්වන ස්ථානය | ලකුණු 06 |

(උපරිම ලකුණු 08)

**සැ.යු. :- ඉහත 2.1.2 හිදී, එක් ශිෂ්‍යයකුට/ශිෂ්‍යාවකට විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීමේදී සාමූහික ක්‍රියාකාරකම් සඳහා ද ලකුණු ලබා දෙනු ලැබේ.**

### 2.2. 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යයා/ශිෂ්‍යාවන් සඳහා පමණි.

**2.2.1. ශිෂ්‍යයා ශිෂ්‍යාව 2023 වර්ෂයේ පැවති අවසාන වාර පරීක්ෂණයේ දී ලබා ඇති ස්ථානය**

| | |
|---|---|
| 01 වන ස්ථානය සිට 03 වන ස්ථානය දක්වා | ලකුණු 50 |
| 04 වන ස්ථානය සිට 06 වන ස්ථානය දක්වා | ලකුණු 45 |
| 07 වන ස්ථානය සිට 10 වන ස්ථානය දක්වා | ලකුණු 40 |
| 11 වන ස්ථානය සිට 15 වන ස්ථානය දක්වා | ලකුණු 35 |
| 16 වන ස්ථානය සිට 20 වන ස්ථානය දක්වා | ලකුණු 30 |
| | (උපරිම ලකුණු 50) |

2.2.2. විෂය සමගාමී ක්‍රියාකාරකම් (ක්‍රීඩා, සෞන්දර්ය සහ වෙනත්)

පාසල් මට්ටමින් ක්‍රියාත්මක තනි/ කණ්ඩායම් ක්‍රීඩා සහ මළල ක්‍රීඩා, විෂය සමගාමී ක්‍රියාකාරකම් (සමිති සමාගම් යනාදිය ද ඇතුළත් ව) ආදිය මගින් ලබා ඇති ජයග්‍රහණ

| | පාසල් මට්ටම | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|---|
| පළමුවන ස්ථානය | 05 | 06 | 07 | 08 |
| දෙවන ස්ථානය | 04 | 05 | 06 | 07 |
| තුන්වන ස්ථානය | 03 | 04 | 05 | 06 |

(උපරිම ලකුණු 08)

සැ.යු. :-

- එක් අවුරුද්දකට පමණක් ලකුණු ලබා දීමට යටත්ව, ආසන්න පසුගිය වසර 03 ක් සලකා බැලිම සුදුසු ය.
- ඉහත 2.2.2හිදී, එක් ශිෂ්‍යයකුට/ශිෂ්‍යාවකට එක ම විෂය සමගාමී ක්‍රියාකාරකමක් සඳහා ජාතික, පළාත්, කලාප සහ පාසල් යන මට්ටම් තුනේ ම අනුයාත වසර 03කට අදාළ ව ජයග්‍රහණ පවතී නම් ලකුණු දීමේදී සැලකිල්ලට ගත යුත්තේ ඉහළ ම ලකුණු මට්ටම පමණි.

03. <u>ශිෂ්‍ය නායකත්වය - සියලු ශ්‍රේණි සඳහා</u>

| | |
|---|---|
| පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක / උප ප්‍රධාන ශිෂ්‍ය නායක | - ලකුණු 07 |
| ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/කණිෂ්ඨ ) | - ලකුණු 06 |
| පන්ති නායක | - ලකුණු 05 |

(උපරිම ලකුණු 07)

සැ.යු. :- ඉහත 03 හිදි ලකුණු දීමේ දී සැලකිල්ලට ගතයුත්තේ ඉහළම මට්ටම් පමණි.

04. <u>ශිෂ්‍යයා/ශිෂ්‍යාව දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම. - සියලු ශ්‍රේණි සඳහා</u>

**(දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් නිකුත් කළ සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.)**

දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම. - ලකුණු 10
(වසරකට වැඩි කාලයක් දහම් අධ්‍යාපනය ලැබීම සහ මේ වන විටත් දහම් පාසලක ශිෂ්‍ය ශිෂ්‍යාවක ලෙස කටයුතු කිරීම.)

(උපරිම ලකුණු 10)

- සියලු ලියාපදිංචි ආගමික දහම් පාසල් මේ යටතට අයත් වේ.

**ඔබට තවදුරටත් තොරතුරු දැනගැනීමට අවශ්‍ය නම් පහත සඳහන් විද්‍යුත් ලිපිනයට (Email) පණිවිඩයක් යොමු කිරීම මගින් හෝ දුරකථන අංක වෙත ඇමතුමක් ලබා දිම මගින් සිදු කළ හැකි ය.**

විද්‍යුත් ලිපිනයට **(Email)** :- pfschol@presidentsoffice.lk

**011 -2 354 354 - දිගු අංක :- 4830/ 4835/ 4837**

**074 - 085 4527 (WhatsApp මගින් යොමු වන පණිවුඩ පමණි )**

ආකෘති 1

**අධ්‍යාපන කටයුතු සඳහා ආර්ථික අපහසුතා සහිත 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනැමෙන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන - 2024/2025**

(එක් එක් පාසල් වශයෙන් තේරීපත්වන ශිෂ්‍යත්වලාභීන්ගේ ලකුණු අනුපිළිවෙල මත එක් ස්ථානයකට ඇතුළත් වන සේ මෙම ආකෘතිය සම්පූර්ණ කළ යුතුය.)

පළාත :- දිස්ත්‍රික්කය :- අධ්‍යාපන කලාපය :-

| අධ්‍යාපනය ලබන පාසලේ නම | අනුක්‍රමික අංකය | ශිෂ්‍යත්වලාභියාගේ නම | ස්ත්‍රී/ පුරුෂ භාවය | පෞද්ගලික ලිපිනය | ලබාගත් ලකුණු |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

කලාපයේ තේරීම් කමිටුව සාමාජිකයාගේ නම | තනතුර | රාජකාරී ලිපිනය | අත්සන

1.

2.

3.

දිනය :-

ඉහත තෝරාගත් සිසු නාම ලේඛනය නිර්දේශ කරමි.

දිනය :- ................................... නම, අත්සන හා නිලමුද්‍රාව :- .........................................
(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ)

ඉහත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක විසින් නිර්දේශ කර ඉදිරිපත් කර ඇති තෝරාගත් සිසු නාම ලේඛණය නිර්දේශ කරමි.

දිනය :- ................................... නම, අත්සන හා නිලමුද්‍රාව :- .........................................
(පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ)

## ඇකෘති 01 සම්පූර්ණ කිරීමේදි පහත සඳහන් උපදෙස් පිළිබඳව සැලකිලිමත් විය යුතුය. :-

I. MS - Excel Sheet එකක් ආකාරයට තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

II. සෑම පාසලකින්ම ශිෂ්‍යත්වලාභීන් උපරිම සංඛ්‍යාව ඇමුණුම 01හි සඳහන් ආකාරයට තෝරාගත යුතු අතර, පාසල් වශයෙන් වෙන් වෙන්ව සඳහන් කළ යුතුය.

උදා :-

| අධ්‍යාපනය ලබන පාසලේ නම | අනුක්‍රමික අංකය | ශිෂ්‍යත්වලාභියාගේ නම | ස්ත්‍රී/ පුරුෂ භාවය | පෞද්ගලික ලිපිනය | ලබාගත් ලකුණු |
|---|---|---|---|---|---|
| ආනන්ද විද්‍යාලය | 01 | ඒ බී සී සේනානායක | | | |
| | 02 | බී ඒ සී ගුණරත්න | | | |
| (උපරිම ශිෂ්‍යත්වලාභීන් ගණන ඇමුණුම 01හි සඳහන් ආකාරයට) | 03 | බී සී ඒ වීරසිංහ | | | |
| | .<br>.<br>. | | | | |
| නාලන්දා විද්‍යාලය | 01 | ඒ බී සී රත්නායක | | | |
| | 02 | බී ඒ සී කුමාරි | | | |
| | .<br>.<br>. | | | | |

III. ශිෂ්‍යත්වලාභීන්ගේ නම් සඳහන් කර එවන විට මුලකුරු සහිතව සඳහන් කළ යුතු අතර මුලකුරු අතර තිතක් නොතබා එක් හිස්තැනක් (Space 1ක්) පමණක් තැබිය යුතුය.

උදා- ඒ බී සී සේනානායක √ ඒ.බී.සී.සේනානායක x

IV. ලිපිනය සඳහන් කිරීමේදි ශිෂ්‍යත්වලාභියාගේ නිවැරදි ලිපිනය සඳහන් කිරීම කළ යුතු වේ.

V. කලාපීය තේරීම් කමිටුවේ සමාජිකයින් අත්සන් කරන ලද ලේඛනය නිර්දේශ කිරීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවීම කළ යුතු අතර, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් එම ලේඛනය නිර්දේශ කර එවීමට කටයුතු කළ යුතුය.

ඇමුණුම 05

Forms 02

## List of names recommended for scholarships program 2024/2025

**Province :-** **District :-** **Educational Zone :-**

Name of the coordinating officer of the ZEO :-
Contact Detail,

Mobile No :- Office Tel. No :-
Whatsapp No :- Email Adderss : -

| 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 | 08 | 09 | 10 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| School Name | Serial No. | Name of the Student | Name of the Parent | Parent's NIC No | Bank & Branch | Branch Code | Joint Account Number | Mobile Num. (SMS ) | Mobile Num. | Address |
| | | | | | | | | | | |

..............................
**Name & Signature (Official Seal)**
**Zonal Education Director**

Date :-

**ආකෘති 02 පිරවීමේදී පහත සඳහන් උපදෙස් පිළිබඳව සැළකිළිමත් විය යුතුය.**

1. ආකෘති පත්‍රය 02 ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පුරවා එවිය යුතුය.

2. **MS - Excel Sheet** එකක් ආකාරයට තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

3. **"Times New Roman"** ආකාරයට අකුරු ප්‍රමාණය **11** න් ඉහත ආකෘති පත්‍ර 02 සම්පූර්ණ කර එවිය යුතුය.

4. ශිෂ්‍යත්වලාභීන්ගේ සහ මව/පියා/භාරකරුගේ නම් සඳහන් කර එවන තීරුව මුලකුරු සහිතව සඳහන් කළ යුතු අතර, මුලකුරු අතර තිතක් නොතබා එක් හිස්තැනක් (Space 1ක්) පමණක් තැබිය යුතුය.

   උදා- A B C Senanayake | √ |    A.B.C.Senanayake | x |

5. ශිෂ්‍යත්වලාභීන්ගේ දුරකථන අංකය සඳහන් කිරීමේදී සැම විටම පහත පරිදි නිවැරදිව සඳහන් කිරීම කළ යුතුය.

   උදා- 0771111111 - √
   077 1111111 - **x**    077 - 1111111 - **x**

6. සියළුම ශිෂ්‍යාධාරලාභීන් සඳහා ශිෂ්‍යත්ව මුදල් ගෙවීම් කිරීම සඳහා මහජන බැංකුවේ, **ලංකා බැංකුවේ හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ශිෂ්‍යයත්වලාභියාගේ සහ මව/පියා/භාරකරුගේ හවුල්කාරීත්වයෙන් යුතුව පවතින (බද්ධ ගිණුමක්) සක්‍රිය බැංකු** ගිණුමක ගිණුම් තොරතුරු ලබාදිය යුතුවේ.

7. එම තොරතුරු සනාථ කරගැනීම සඳහා අදාළ බද්ධ බැංකු ගිණුම් පොතේ තොරතුරු පිටුවේ පැහැදිලි ඡායා පිටපතක් හා මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් විදුහල්පති විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.

දිනය :-

ලේකම්
ජනාධිපති අරමුදල

**<u>අධ්‍යාපන කටයුතු සඳහා ආර්ථික අපහසුතා සහිත 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනැමෙන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන - 2024/2025</u>**

විධිමත් පරිදි ශිෂ්‍ය කාර්ය දර්ශකය ලබා නව පාසලකට ඇතුළත් වූ ශිෂ්‍යත්වලාභීන් පිළිබඳ දැන්වීම.

ශිෂ්‍යත්වලාභියාගේ නම :- ..................................................

ඉගෙනුම ලැබූ පාසල හා ලිපිනය :- ..................................................

පාසල අයත් කලාපය :- ..................................................

ඉගෙනුම ලැබූ ශ්‍රේණිය :- ..................................................

ශිෂ්‍යත්ව ප්‍රතිලාභය ලබා ගත් කාල සීමාව :- ..................................................

පාසලෙන් අස් වූ දිනය :- ..................................................

පාසලෙන් අස්වීමට හේතුව :- ......................................................................................

......................................................................................

(ශිෂ්‍ය කාර්ය දර්ශනයේ පිටපතක් අමුණන්න)

ඇතුළත් වූ නව පාසලේ නම හා ලිපිනය :- ..................................................
එම පාසල අයත් කලාපය :- ..................................................
ඇතුළත් වූ ශ්‍රේණිය :- ..................................................

ඉහත දැක්වෙන කරුණු සත්‍ය හා නිවැරදි බව දන්වා සිටිමි.

දිනය : ........................ ......................... ..........................................................

අයදුම්කරුගේ අත්සන මව/පියා/භාරකරුගේ නම සහ අත්සන

---

**ලේකම්, ජනාධිපති අරමුදල,**

ඉහත නම සඳහන් ශිෂ්‍යත්වලාභියා වන ........................................ ශිෂ්‍යා/ශිෂ්‍යාව .......................... දින මෙම පාසලට ඇතුළත් වූ බවත්, මේ වන විට .......... ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවත් සහතික කරමි.

දිනය : ........................ ..........................................................

විදුහල්පතිගේ නම සහ අත්සන
(නිල මුද්‍රාව)